**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 02 (අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය - ඒජන්සි ෆ්‍රැන්චයිස් ද ඩිවලොප්මන්ට් - ගිවිසුම් අංක සී.එල්.කේ.1008-01පී ) - 2024**

**------------------------------------------------------------------------------------------------------------------**

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතියේ (අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ඒජන්සි ෆ්‍රැන්චයිස් ද ඩිවලොප්මන්ට් අතර 2014 සැප්තැම්බර් 29 දින එළඹී අංක සී.එල්.කේ.1008-01පී දරණ ණය ගිවිසුමේ 3.4.2(එච්)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ, තිරසාර බව පෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,000 කට සමාන එජඩො මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් මූල්‍යනය කිරීමට ඒජන්සි ෆ්‍රැන්චයිස් ද ඩිවලොප්මන්ට් එකඟවී තිබුණි. ඉතිරි එජඩො මිලියන 30 සමාන රු.මිලියන 3,900 ක වටිනාකම ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කර තිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව 2024 දෙසැම්බර් 31 දින දක්වා සිව් වතාවක් දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ කළමතය**

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2024 දෙසැම්බර් 31 දිනට වැඩසටහන - ව්‍යාපෘති 2හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තරපාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණය | වටිනාකම රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 39 (අ) ඡේදය ප්‍රකාරව, ව්‍යාපෘතියට අදාළ විදේශ ණයට සම්බන්ධ රු.මිලියන 1,253 ක සමානාත්මතා ගැලපුම | 1,253 | ව්‍යාපෘතිය, 2025 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් ඇතුලත් කරනු | ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | | ඇත. | |
| (ආ) | අඹතලේ ජල පවිත්‍රාගාර පරිශ්‍රයේ රු.මිලියන 37.31 ක වියදමින් ඉදිකරන ලද තෙමහල් ගොඩනැගිල්ල 2024 පෙබරවාරි 01 වන දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදී තිබුණි. කෙසේ වෙතත් එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 මඟින් අවශ්‍ය පරිදි ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර වත්කම් වල වටිනාකම සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | 37.31 | ව්‍යාපෘතිය 2025 වර්ෂය තුළ තෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ල ප්‍රාග්ධනීකරණය කරනු ඇත. | ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට අනුකූල විය යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි අංක 507(1), 756 | 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතිය, 2025 වර්ෂයේදී වත්කම් සමීක්ෂණයක් සිදුකරනු ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 29 වන දින එහි කටයුතු ආරම්භ කර තිබූ අතර 2019 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය සැලසුම් කල කාලය තුළ ඉලක්ක සපුරා ගැනීමට අසමත් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාලසීමාව 2024 දෙසැම්බර් 31 දින දක්වා සිව්වතාවක් දීර්ඝ කර තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව, ව්‍යාපෘතිය ආරම්භකර වසර 10 ක් ගත වූ පසුවත් 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් සියයට 91.46 ක් සහ සියයට 83.02 ක් ව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී ද ව්‍යාපෘතිය භෞතික වශයෙන් සියයට 9.54 ක ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘතියේ සංරචක අනුව ප්‍රගතිය පහත පරිදි විය.

| ක්‍රියාකාරකම | 2024 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත ඉලක්කය (%) | සත්‍ය ප්‍රගතිය (%) | | | |
| අඹතලේ නිෂ්පාදන පහසුකම්වල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සහ | 100 | 82.07 | නියමිත දිනට පෙර ව්‍යාපෘතිය නිම කිරීමේ අවදානම් | මෙම කොන්ත්‍රාත්තුව මූලික වශයෙන් පාලනය කළ නොහැකි විවිධ හේතූන් මත ප්‍රමාද වූ අතර | අතිරේක පිරිවැය වළක්වා ගැනීම සඳහා ඉතිරි වැඩ තවදුරටත් |

| | | | |
|---|---|---|---|
| බලශක්ති ඉතිරිකිරීම සඳහා සුදුසු ධාරිතාවකින් යුත් කාර්යක්ෂම පොම්ප ස්ථාපනය කිරීම, අඩු සර්ෂණය හරහා සම්ප්‍රේෂණ පාඩු අවම කිරීම සහ අනෙකුත් නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් බලශක්තිය ඉතිරිකිරීම. | තත්වයක් පැවතිය හැක. | එය 2026 ජුනි 30 වන විට සම්පූර්ණයෙන්ම අවසන්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සැලසුම් සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත්තුව, රු.මිලියන 343 ට මාස 36 ක කාල රාමුවක් සහිතව 2015 දී ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් කාල දිගු වාර 07 ක් හරහා මාස 67 කින් කාලය ඉක්ම ගොස් තිබුණි. 2025 ජූලි 09 වන විට එහි පිරිවැය රු.මිලියන 768 කින් ඉක්මවා ගොස් මූලික අයවැය මෙන් දෙගුණයකටත් වඩා වැඩි වී තිබූ අතර විධිමත් අනුමැතියකින් තොරව සේවාව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පැවතිණි. කළමණාකාරීත්වය මෙම ගැටළුව විසඳීමට අපොහොසත් වී ඇති අතර ඒ වෙනුවට අඛණ්ඩව කාල දීර්ඝ කිරීම් ලබාදීම සහ අතිරේක ගෙවීම් අනුමත කිරීම සිදු කර තිබුණි. | ව්‍යාපෘතිය 2026 ජූනි 30 දිනට නිම කිරීමට බලාපොරොත්තු වන අතර ඒ එෆ් ඩී ද ඩිවලොප්මන්ට් ආයතනය, උපදේශණ සේවා කොන්ත්‍රාත්තුව ව්‍යාපෘතිය නිම කරන තෙක් අඛණ්ඩව පවත්වාගෙන යන ලෙස ද දන්වා ඇත. | අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම සඳහා ව්‍යාපෘති කළමණාකරණය විසින් කාර්යයන් සමීපව අධීක්ෂණය කල යුතුවේ. |
| (ආ) | ගොතටුව ඝණ මීටර් 15,000 ජලාශය සහ බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සමඟ කි.මී.05 ක් සඳහා ඩී අයි නල සැපයීම සහ එළීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2022 ජුනි 06 වන විට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණු අතර පසුව ඒ සඳහා 2025 පෙබරවාරි 28 දක්වා 08 වතාවක් කාල දිගුවන් ලබාදී තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 98.07 ක් හා සියයට 96.61 ක් ව පැවතුණි. කෙසේ වෙතත් | ගැටළු ලැයිස්තුවෙහි ඇතුලත් ඉතිරි වැඩ, භාර ගැනීමේ සහතිකය නිකුත් කිරීමේ දින සිට මාස 03 ඇතුලත සම්පූර්ණ කරනු ඇත. | සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියේ ප්‍රගතිය මන්දගාමී වේගයක් පෙන්නුම් කර තිබුණි. | | |
| (ඇ) | සමස්ත ව්‍යාපෘතියෙන් සියයට 45 ක් පමණ වන අයි.සී.බී. 05 කොන්ත්‍රාත්තුව, අඹතලේ නිෂ්පාදන පහසුකම් වල විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සහ සුදුසු ධාරිතාවයකින් යුතු කාර්යක්ෂම පොම්ප ස්ථාපිත කිරීම මඟින් බලශක්තිය ඉතිරි කිරීම සඳහා ආරම්භ කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 වන විට මුලිකව නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් වරට නිම කල යුතු දින වන 2024 දෙසැම්බර් 31 වන විට 6 වතාවක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. 2025 මැයි 31 වන විට ව්‍යාපෘතිය විසින් සියයට 85 ක භෞතික ප්‍රගතියකට ළඟාවී තිබුණද වාර්තා කර තිබූ මූල්‍ය ප්‍රගතිය සියයට 62 ක් පමණක් විය.<br>ව්‍යාපෘතිය එහි ඉලක්ක සපුරාගැනීමට දිගින් දිගටම අසමත් වන බවත් විධිමත් කාල දිගුවකින් තොරව ක්‍රියාත්මක වන බවත් ව්‍යාපෘති උපදේශක කමිටුව වාර්තා කර තිබුණි. | ව්‍යාපෘති කළමණාකරණය, අමතර පිරිවැයක් රහිතව කාල දිගුව ප්‍රදානය කිරීමට තීරණය කර ඇත. ඒ අනුව අයි.සී.බී. 05 හි අවසාන කාල දිගුව 2025 සැප්තැම්බර් 30 දක්වා වලංගු වේ. 2025 ජුනි 30 දිනට කොන්ත්‍රාත්තුව නිම කිරීමට අපේක්ෂා කෙරේ. | නියමිත කාලය තුළ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතිය සඳහා අයිඩීඑච් රෝහල් පරිශ්‍රයේ කාර්යය මණ්ඩල නිල නිවාස ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 14 දින රු.මිලියන 91.65 ක වටිනාකමකට දින 365 ක් තුල නිම කිරීමට පුද්ගලික ඉදිකිරීම් සමාගමකට ප්‍රදානය කර තිබුණි. ඉදිකිරීම් විෂය පථය වෙනස් වීමෙන් පසුව සහ මුලිකව එකඟ වූ කොන්ත්‍රාත් දිනයේ සිට දින 490 කට පසු සංශෝධිත කොන්ත්‍රාත්තුව සඳහා අඹතලේ ජල පවිත්‍රාගාර පරිශ්‍රයේ මහල් 3 කින් යුතු ගොඩනැගිලි ඒකක 2 ක් රු.මිලියන117 කට ඉදිකිරීමට තීරණය කර තිබුණි.කෙසේ වෙතත්, කාල දිගු වාර 4 ක් සහ දින 864 කට පසුවද, කොන්ත්‍රාත් වැඩ වලින් සියයට 28 ක් ඉතිරිව තිබූ අතර 2024 දෙසැම්බර් 9 | විෂය පථය වෙනස් කිරීම සඳහා අත්සන් කරන ලද සංශෝධනය මත පදනම්ව, නව කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.117,310,181 ක් විය. කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය එකඟතාවය මත දෙපාර්ශවයටම වාසිදායක විසඳුමක් ලෙස 2024 දී අවසන් කරන විට සහතික කරන ලද ව්‍යාපෘති පිරිවැය රු.මි.131 ක් වූ අතර මූල්‍ය ගාස්තු රහිතව රු.මි.128.77 ක් ගෙවා ඇත. අනුමත කරන ලද මිල ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවීය. ඉතිරි වැඩ සඳහා මිල ගණන්, ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ සසඳා අඩුම මිල කැඳවුම තෝරාගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. මෙම කාර්යය මණ්ඩල නිල නිවාසයේ ප්‍රතිලාභීන්ට ප්‍රයෝජනය ලබාගැනීම සඳහා ඉතිරි කොටස කෙටි කාලයක් තුල නිම කිරීම තීරණාත්මක සාධකයක් විය. නිසි උප කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් පසු, ඉතිරි | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් උල්ලංඝණය කල වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

වන දින කොන්ත්‍රාත් වැඩ අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කර තිබුණි. ඉතිරි වැඩ වෙනම කොන්ත්‍රාත්තුවක් යටතේ අවසන් කල හැකි බවටද එකඟ වී තිබුණි. මේ වන විට ව්‍යාපෘතිය විසින් මිල විචලතා ඇතුළුව මුළු කොන්ත්‍රාත් වටිනාකම වශයෙන් රු.මි.131 ක් ගෙවා තිබුණි.

ඉතිරි වැඩ නිම කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:3 වගන්තියට අනුව ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. විවෘත තරඟකාරී ලංසු ක්‍රියාපටිපාටිය වෙනුවට මණ්ඩලය විසින් අයි.සී.බී. 05 කොන්ත්‍රාත්කරුගෙන් අවිධිමත් ලෙස මිල කැඳවීම් තුනක් ලබාගෙන තිබුණි.

ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් පත්කරන ලද කමිටුවේ නිර්දේශ මත පදනම්ව, අසාධු ලේඛනගත කළයුතුව තිබූ ඉහත අසාර්ථක කොන්ත්‍රාත්කරු වෙතම කොන්ත්‍රාත්තුව රු.මි.45.43 කට ප්‍රදානය කර තිබුණි.

මෙම කොන්ත්‍රාත්තුව සඳහා දරන ලද මුළු පිරිවැය රු.මි.193 දක්වා ඉහල ගොස් ඇති බවත් එය මුල් කොන්ත්‍රාත්තුව හා සසඳන විට ආසන්න වශයෙන් සියයට 110 ක වැඩි වීමක් නියෝජනය කරන බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

වැඩ එම කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කරන ලදී.

(ඉ) ජලය පිරිපහදු කිරීමෙන් පසු දිනකට ආසන්න වශයෙන් ඝණ මීටර් 19,643 ක පමණ පසු සේදුම් ජලය නැවත ගඟට මුදාහරිනු ලබයි. ව්‍යාපෘතියෙන් සපයන ලද තොරතුරු අනුව අඹතලේ ජල පිරිපහදු යන්ත්‍රාගාරයෙන් ජලය ඝණ මීටරයක නිෂ්පාදන පිරිවැය රු. 9.59 ක් බව අනාවරණය විය. පසුසේදුම් ප්‍රතිසාධන පද්ධතිය ඉදිකිරීමේ ප්‍රමාදය සැලකිල්ලට ගැනීමේදී මෙමඟින් සිදු වූ ආර්ථික අලාභය ආසන්න වශයෙන් රු.මි. 231 ක් ලෙස ගණන් බලා තිබුණි. තවද ජලය පිරිපහදු කිරීමෙන් පසු ඉතිරිවන රසායනික ද්‍රව්‍ය අඩංගු රොන්මඩ ඇල මාර්ගයක් හරහා පරිසරයට විශාල

මෙම ගැටළුව මගහරවාගැනීම සඳහා පසුසේදුම් ප්‍රතිසාධන පද්ධතිය නිර්මාණය කර ඇත. තවමත් එහි ඉදිකිරීම් අඛණ්ඩව සිදුවෙමින් පවතින අතර ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසු සහ එහි ක්‍රියාකාරීත්වය ආරම්භ කිරීමෙන් අනතුරුව මෙම ගැටළුව විසඳාගත හැකිය.

නියමිත පරිදි කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු අතර වගකිය යුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| | හානියක් සිදුකරමින් අවිධිමත් ලෙස ජල මූලාශ්‍රයට මුදාහරින බවට තවදුරටත් නිරීක්ෂණය විය. | | |
| (ඊ) | එළි හවුස් පොම්පාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව මගින් (අයිසීබී 05) එළි හවුස් ජලාශය වෙත වැඩි පීඩනයකින් ජලය සැපයීමට පොම්ප 4 ක් ස්ථාපනය කර තිබුණි. කෙසේ වෙතත් 2025 ජූලි 09 විගණිත දින වන විටත් කි.මී. 9 ක ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය පොම්පාගාරයට සම්බන්ධ කර නොතිබුණි. 2024 සැප්තැම්බර් ජ්එෆ්ඩී මිෂන් වාර්තාවට අනුව අයිසීබී 5 සැපයුම්කරු විසින් සපයන ලද Y හැඩැති - T කොටස්වල නිෂ්පාදන දෝෂයක් ඊට හේතු වන බව අනාවරණය කරගෙන තිබුණි. මෙම දෝෂය හඳුනාගෙන මාස 09 ක් ගතවී ඇතත්, ව්‍යාපෘති කළමණාකරණය එම ගැටළු නිවැරදි කිරීමට පියවර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙය කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය තවදුරටත් ප්‍රමාද නොකරන අතර භූගත ජලාශයේ ඉතිරි වැඩ කටයුතු 2025 දෙසැම්බර් අවසානය වන විට සම්පූර්ණ කල හැකිය. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

### 3.3 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් බලශක්ති කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා වූ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණු අතර මෙයට පැරණි පොම්ප ප්‍රතිස්ථාපනය කිරීම, නව භූගත ජලාශ ඉදිකිරීම සහ සර්ෂණ අලාභ අඩු කිරීම සඳහා විශාල නල මාර්ග ස්ථාපනය කිරීම ඇතුලත්ව තිබුණි. විගණන දින වන විට, නව පොම්ප 17 න් 9 ක් පමණක් ක්‍රියාත්මක තත්වයේ පැවතුණි. ගොතටුව පොම්පාගාරයේ පොම්ප 4 ස්ථාපනය කර නොතිබුණු අතර එළි හවුස් පොම්පාගාරයේ පොම්ප 4 ස්ථාපනය කර තිබුණද මි.මී.1,200 සම්ප්‍රේෂණ නළයේ සම්බන්ධතා ගැටළුව හේතුවෙන් සේවා තත්ත්වයේ නොපැවතුණි. තවද සැලසුම් කරන ලද ප්‍රවාහ මීටර් 16 න් 11 ක් සහ සර්ජ් වෙසල්ස් 11 න් 6 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර එස් සී ඒ ඩී ඒ පද්ධතිය | සැලසුම් කළ පරිදි අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. මෙම අදියරේදී බලශක්ති ඉතුරුම් සඳහා ව්‍යාපෘතියේ ප්‍රතිඵලයන් නිරීක්ෂණය කල නොහැකි නමුත් අවසන් වූ පසු ව්‍යාපෘතියේ බලශක්ති ඉතිරිකිරීම සඳහා බලශක්ති විගණනයක් සිදුකරනු ලැබේ. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුනොකිරීමට සහ සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමට අපොහොසත්වීමට හේතුව සොයා බැලීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක කර නොතිබුණි. එමගින් ව්‍යාපෘතියේ බලශක්ති ඉතිරිකිරීමේ අරමුණු අවදානමට ලක්ව තිබුණි. | | |

### 3.4 නිෂ්ක්‍රිය / භාවිතයට නොගත් / ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | දුර්වල ව්‍යාපෘති ප්‍රගතිය හේතුවෙන්, 2024 දෙසැම්බර් 31 වන විට මුළු ණය පහසුකමින් සියයට 60 ක් පමණක් භාවිතා කර තිබුණි. ණය දෙන ආයතනය මුදල් ලබාදීම නවතා දමා තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස උපයෝජනය නොකල ණය ශේෂය සඳහා බැඳීම් ගාස්තු ලෙස, රජයට රු.මි.390.4 ක මුළු මුදලක් අනාර්ථිකව ගෙවීමට සිදුව තිබුණි. | ආර්ථික අර්බුදය හේතුවෙන් ඒඑෆ්ඩී විසින් අරමුදල් බෙදාහැරීම අත්හිටුවන ලදී. ඒඑෆ්ඩී හි නිර්දේශ මත පදනම්ව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද පූර්ව මූල්‍යකරණ ගිවිසුමක් යටතේ භාණ්ඩාගාර අරමුදල් සමඟ ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යනු ලැබේ. පසුගිය ඒඑෆ්ඩී මිෂන් මඟින් මුළු ණය ශේෂය ලබාදෙන බවට තහවුරු කල අතර එතෙක් අඛණ්ඩව භාණ්ඩාගාර අරමුදල් ඉල්ලුම් කරන ලදී. | ව්‍යාපෘති අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය. |

### 3.5 පාලන පද්ධතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛය මගින් නියම කර ඇති පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් වී නොතිබුණි. | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ගනුදෙනුව අභ්‍යන්තර විගණනයට භාජනය වී නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කල යුතුය. |